# TVEC පුවත්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ජූලි, 2021 ISSN 2012 - 5054

## ඇතුල් පිටු


- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නව සභාපති
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නව අධ්‍යක්ෂ ජනරාල්
- සමස්ත වෘත්තීය හා කාර්මික පුහුණු ක්ෂේත්‍රය සඳහා වන ජාතික සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ කාල වකවානුවක කොමිෂන් සභාව සිටීත්...
- ආයතන ලියාපදිංචි, ප්‍රතීතන හා තත්ත්ව කළමනාකරණ ක්‍රමවේදය
- ඇගයුම්කරුවන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම
- ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව ශ්‍රම වෙළඳපොළට ගැලපෙනවාද?
- සංවර්ධනය කරන ලද නව ජාතික නිපුණතා සම්මතයන් හා විෂය මාලා, 2020


**2021 ජූලි මාසයවන තෙක් නිකුත් වූ NVQ සහතික ප්‍රමාණය 490,202**

## තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නව සභාපති



තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නව සභාපති ලෙස 2021 ජනවාරි 27 වන දින පත්වීම් භාර ගන්නා ලද ඉංජිනේරු උදේනි වික්‍රමසිංහ මහතා ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා විය. තවද ඔහු 2006 - 2010 කාලය තුල රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (තාක්ෂණ) ලෙස කටයුතු කරන ලදී. ඔහු පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධිධාරියකු වන අතර, මොරටුව විශ්ව විද්‍යාලයේ හා මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධි ලබා ගෙන ඇත.

## තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නව අධ්‍යක්ෂ ජනරාල්



තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නව අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ආචාර්ය කේ. ඒ. ලලිතධීර මහතා 2021.04.27 දින වැඩ භාර ගන්නා ලදී. ආචාර්ය ලලිතධීර මහතා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු, පරිපාලන, පර්යේෂණ සහ ව්‍යාපෘති යන ක්ෂේත්‍රවල වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇති නිළධාරියෙකි. විශේෂයෙන් ඔහු විසින් පර්යේෂණ රැසක් සිදු කර ඇති අතර පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීනයෙකු වේ.

එතුමා කොමිසම් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් වීමට පෙර ජාතික මානව සම්පත් සංවර්ධන සභාවේ අධ්‍යක්ෂ ලෙස සේවය කරමින් සිටියේය.

ආචාර්ය ලලිතධීර මහතා රුහුණු විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධිධාරියෙකු වන අතර කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධිය ලබාගෙන ඇත. එතුමා ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ලබාගෙන ඇති අතර, කාර්මික අධ්‍යාපනයක් ශ්‍රම වෙළඳපොල කෙරෙහි ඇති කරන බලපෑම යන මැයෙන් ආචාර්ය උපාධිය සඳහා පර්යේෂණ සිදුකර ඇත.

# සමස්ත වෘත්තීය හා කාර්මික පුහුණු ක්ෂේත්‍රය සඳහා වන ජාතික සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ කාල වකවානුවක කොමිෂන් සභාව සිටීත්...

## (TVEC is  in the age Era of Compiling a National Department Plan for TVEC Sector.)

නව මඟක් ඔස්සේ යමින් වෘත්තීය හා කාර්මික පුහුණුව මේ වනවිට ඉතාම ශක්තිමත් තැනකට පැමිණ ඇති බව සඳහන් කරන්නේ ඉතා සතුටිනි. නව කාර්මික ලෝකයට මුහුණ දීම උදෙසා කාලෝචිතව සැකසුනු ජාතික සංවර්ධන සැලැස්ම පහත සඳහන් තේමා හය යටතේ දිවෙනු ඇත.

1. තාක්ෂණික වාත්තීය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සඳහා ප්‍රවේශය.
2. පුහුණු සංවර්ධනය හා යතාර්තීකරණය.
3. ශ්‍රම වෙළඳපල තොරතුරු පුහුණු තොරතුරු සහ ඩිජිටල්කරණය.
4. කර්මාන්ත සම්බන්ධතා සහ ශ්‍රම බලකායේ සංවර්ධනය.
5. තෘතියික වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි තත්ත්ව සහතික කිරීම සහ පිළිගැනීම.
6. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි භෞතික හා මූල්‍ය සම්පත් පිළිබඳ මානව සම්පත් ඉදිරි දර්ශනය කළමනාකරණය කිරීම.

තවද මෙම සැලැස්ම සකස් කිරීම සඳහා පහත සදහන් මූලාශ්‍ර උපයෝගී කර ගෙන ඇති අතර 2021 වසරේ සිට වෘත්තිය හා කාර්මික පුහුණු ක්ෂේත්‍රයේ ඇති ආයතනික  වාර්ෂික සැලැස්ම මේ අනුව සකස් වෙනු ඇත. එමෙන්ම මීට සමගාමීව ජාතික පුහුණු සැලැස්මක්ද වාර්ෂිකව සකස් වෙනු ඇත. මේ වනවිට ජාතික සංවර්ධන සැලැස්ම සදා නිමකොට ගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍යංශය වෙත ලබාදී ඇති අතර නුදුරු දිනයකදී  TVEC වෙබ් අඩවිය (www.tvec.gov.lk) හරහා ඔබට බා ගත කරගත හැකිවනු ඇත.

1. රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය.
2. කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය.
3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත හා සංශෝධනය.
4. ශ්‍රී ලංකා ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව.
5. ශ්‍රී ලංකාවේ TVEC අංශයේ අනාගත දිශාවන් පිළිබඳ වාර්ථාව.
6. ශ්‍රී ලංකාව සඳහා ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තිය.

ප්‍රියන්ත ධර්මසේන - සහකාර අධ්‍යක්ෂ
ජාතික වෘත්තීය සුදුසුකම් අංශය



# ආයතන ලියාපදිංචි, ප්‍රතීතන හා තත්ත්ව කළමනාකරණ ක්‍රමවේදය




## ආයතන ලියාපදිංචිය

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය ලබාදීම සඳහා පිහිටුවනු ලබන ආයතන හා පාඨමාලා තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ. වෘත්තීය පුහුණුව සපයන ආයතන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කිරීම සහ පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා මාර්ගෝපදේශයන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන සභාවේ TVEC.gov.lk වෙබ් අඩවියේ Guideline for Registration of Training Institute යටතේ පළකර ඇත.

ආයතන මගින් පුහුණු කිරීම් ආරම්භ කිරීමට ප්‍රථම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ක්‍රම වේදයක් හඳුන්වාදී ඇත. මෙහිදී විෂය මාලාව, පුහුණු කිරීමේ සැලැස්ම, උපදේශක සුදුසුකම්, යටිතල පහසුකම්, පාඨමාලාව සඳහා අවශ්‍ය උපකරණ හා යන්ත්‍ර සූත්‍ර, මූල්‍යමය හැකියාව සහ ඇගයීම් පැවැත්වීම සඳහා අවශ්‍ය සම්පත් යනාදිය අධීක්ෂණය කිරීමෙන් අනතුරුව Pre-Registration තත්වය සඳහා ලියාපදිංචි අවසරයක් ලබා දෙනු ලබන අතර එය මාස 06ක කාල සීමාවක් වලංගුවේ. Pre-Registration ලබා ගැනීමෙන් මාස 06ක් ඇතුලත පාඨමාලාව ආරම්භ කර ලියාපදිංචිය සඳහා අයදුම් කලයුතු වන්නේය.

පාඨමාලා ප්‍රතීතනය(accreditation) යනු ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුදුසුකම් රාමුවට (NVQSL) අනුකූලව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පාඨමාලාවක් විධිමත් ලෙස පිළිගැනීමයි. මෙහිදී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සම්පාදිත ජාතික වෘත්තීය සුදුසුකම් රාමුවට අනුකූලව පවත්වාගෙන යන පාඨමාලාවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සිදුවේ. මේ සඳහා ජාතික නිපුණතා සම්මතය (NCS) ප්‍රධාන ලේඛනයවේ. නිපුණතා සම්මතයේ දක්වා ඇති නිපුණතාවන්, නිපුණතා පාදක ක්‍රමය යටතේ පුහුණු කිරීම සිදුවන බවට අනුමැතිය ලබාදීම මෙහිදී සිදුවේ. ජාතික නිපුණතා සම්මතය අනුකූලව පවත්වාගෙන යන ලියාපදිංචි පාඨමාලා ප්‍රතීතනය සඳහා ඉල්ලුම් කල හැක. මෙලෙස ප්‍රතීතනය ලබා ගන්නා පාඨමාලා සඳහා අවසන් ඇගයීම TVEC මගින් සිදු කරනු ලබන අතර සුදුසුකම් ලබන්නන් සඳහා NVQ සහතිකපත් නිකුත් කරනු ලබයි.



## පාඨමාලා ප්‍රතීතනය (Accreditation)




## තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS)

තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වනුයේ TVEC හි ලියාපදිංචි වී ඇති ආයතනවල පාඨමාලා ගුණාත්මකභාවය ඉහල නැංවීමයි. මෙහිදී ISO 9001(2008 සහ SLS IWA 2( 2007සම්මතයන් පදනම් කරගෙන තත්ව පරීක්ෂණය සිදු කරයි. ඵලදායී සේවාදායක සබඳතා පවත්වාගැනීම, මූල්‍ය සැලසුම්කරණය සහ පාලනය, විශ්වාසනීය වාර්තා තබා ගැනීම සහ පාරිභෝගික තෘප්තියට හේතු වන ලේඛන කළමනාකරණය යනාදිය මෙමඟින් බලාපොරොත්තුවේ. NVQ 5 සහ NVQ 6 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා පවත්වාගෙනයාම සඳහා ආයතනය තුල තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) ස්ථාපිත කිරීම අනිවාර්යයවේ. දැනට ආයතන 193ක් තුල මෙම තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) සක්‍රීයව ක්‍රියාත්මක වේ.

මෙයට අමතරව ක්ෂේත්‍රයේ ලත් අත්දැකීම් සහ පාඩම් මත පදනම්ව, ගුණාත්මක සංස්කෘතිය නංවාලීම සඳහා තත්ත්ව වැඩිදියුණු කිරීමේ පද්ධතිය (Quality Improvement System) නමින් නව ප්‍රවේශයක් 2016 දී TVEC විසින් ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව විසින් අරමුදල් සපයන නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ මූල්‍ය හා තාක්ෂණික සහාය ඇතිව හඳුන්වා දෙන ලදී. මෙහිදී අවම ප්‍රමිතියක් සහ නිශ්චිත පියවරයන් ක්‍රියාත්මක කිරීම තරු 3 ශ්‍රේණිගත කිරීමකට මඟ පාදයි. තවත් පියවරයන් එකතු කිරීමෙන් තරු 4 ක් හා තරු 5 ක් ශ්‍රේණිගත කිරීම කරනු ලැබේ. ඒ සඳහා පත් කරන ලද ජාතික සම්බන්ධීකරණ කමිටුවේ (NCC) නිර්දේශ මත විසින් නියාමන ආයතනය වන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මඟින් අදාල සහතිකපත් ප්‍රදානය කරනු ලබයි. මෙහි ආයතන ඇගයීම් කටයුතු හා අගයීම්කරුවන් පුහුණු කිරීම TVEC අධීක්ෂණය යටතේ සිදු කරයි. QIS ප්‍රධානතම අරමුණ සියලු දෙනාට යහපත්, ගුණාත්මක හා සතුටුදායි වැඩ පරිසරයක් බිහිකිරීමයි. මේ වනවිට ආයතන 228ක් තුල QIS ස්ථාපිත කර ඇත.



## තත්ත්ව වැඩිදියුණු කිරීමේ පද්ධතිය (Quality Improvement System /QIS)

*ගයන්ති මාසකෝරාල - සහකාර අධ්‍යක්ෂ*
*පාඨමාලා ලියාපදිංචි, පිළිගැනීම් හා තත්ත්ව කළමණාකරන පද්ධති අංශය*



# ඇගයුම්කරුවන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම

2004 වර්ෂය සිට අප කොමිෂන් සභාව මඟින් ක්ෂේත්‍ර ගණනාවක් සඳහා ඇගයුම්කරුවන් පුහුණු කර ඇගයීම් සංචිතයන් පවත්වාගෙන යනු ලබයි.

එම සංචිතය උපයෝගී කරගෙන දිවයිනේ NVQ පාඨමාලා පවත්වනු ලබන රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සිසුන් ඇගයීම් සඳහා ඇගයුම්කරුවන් යොදාගනියි. නමුත් අපගේ ඇගයුම්කරුවන් විවිධ ආයතනවල සහ විවිධ ප්‍රදේශවල, සේවය කරනු ලබන අතර ඔවුන්ගේ තොරතුරු කාලීනව වෙනස් වේ. ඔවුන්ගේ තොරතුරු කලීනව වෙනස්වීම් මත සැමදෙනාටම සම ඇගයීම් අවස්ථාවක් ලබාදීම සඳහා ඔවුන් සම්බන්ධ කරගැනීම අපහසු වී ඇත. අප විසින් මෙම තත්වය මඟහරවා ගැනීම සඳහා 2016 වර්ෂය ඇගයුම්කරුවන්ගේ දත්ත තොරතුරු යවතක්ලීන කල අතර එහි ප්‍රතිඵල 50% මට්ටමකට පැවතුනි. ඉන් අනතුරුව ඇගයීම් අංශය මඟින් එම තත්වයන් තව දුරටත් මඟහරවා ගැනීමේ අරමුණින් ඇගයුම්කරුවන්ගේ තොරතුරු පරිගණකගත පද්ධතිය හරහා යවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් 2020 වසර අවසන් භාගයේ සිට හඳුන්වාදෙන ලදී. ඒ අනුව ඇගයීම් සංචිතයේ සිටින සෑම ඇගයුම්කරුවකුට ම තම තොරතුරු යවත්කාලීන කිරීමේ අවස්ථාව ලබා දී ඇත.


මෙම ක්‍රම හඳුන්වා දීමත් සමඟ ඇගයීම් පත්කිරීමේ බලතල විමධ්‍යගත කරමින් පුහුණු ආයතනවලට පරිගණකගත පද්ධතිය හරහා ස්වයංක්‍රීයව ඇගයීම් කරුවන් පත්කර ගැනීමේ පහසුකම සලසා දී ඇත.

මෙමඟින්, වඩාත් විදිමත් හා ඵලදායි ඇගයීම් සිදුකිරීමේ අවස්ථාව ලබා දෙමින්, ඇගයීම්වල තත්වය ආරක්ෂාකරමින් රටේ තරුණ තරුණියන්ට කර්යක්ෂම සේවාවක් සැපයීම අප කොමිසම් සභාවේ එකම අරමුණ වේ.

*පී.පී.පී. නානායක්කාර - නියෝජ්‍ය අධ්‍යක්ෂ*
*තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය*

# ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව ශ්‍රම වෙළඳපොළට ගැලපෙනවාද?

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණු ක්‍රමවේදය විශේෂ සංධිස්ථානයකට පැමිණ ඇත. ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය හඳුන්වා දෙමින් නිපුණතාව අනුව ඉහළ සුදුසුකම් මට්ටමක් දක්වා ගමන් කිරීමේ අවස්ථාව ලබා දී ඇත. මෙම ක්‍රමවේදය 1 මට්ටමේ සිට 7 වන මට්ටම දක්වා සකස්කර ඇත. ඒ අනුව 1 සිට 4 දක්වා සහතික මට්ටම ද 5 සිට 6 දක්වා ඩිප්ලෝමා සහා උසස් ඩිප්ලෝමා මට්ටම ද 7 උපාධි මට්ටම ද වශයෙන් මට්ටම් කිහිපයක් හඳුන්වා දී ඇත.




මෙම ක්‍රමවේදය කර්මාන්තවල පවතින හඳුනාගත් වෘත්තීන්ට අදාලව නිපුණතා සම්මත සකස් වී ඇති අතර ඕනෑම කෙනෙකුට අධ්‍යාපන සුදුසුකම් වලින් තොරව සහතික මට්ටමේ සිට උපාධියක් දක්වා හැදෑරීමේ හැකියාව පවතී.

ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව ප්‍රධාන වශයෙන් ක්‍රම 02ක් යටතේ ක්‍රියාත්මක වෙයි.

01. මධ්‍යස්ථාන පදනම් කර ගත් පුහුණුව.


02. කර්මාන්ත පදනම් කරගත් ආධුනිකත්ව පුහුණුව වශයෙනි.

මෙම ක්‍රම වේදයන් තුළින් වාර්ෂිකව නිපුණ ශිල්පීන් 250,000 ක් පමණ වෘත්තීය පුහුණුව සඳහා බඳවා ගන්නා අතර වාර්ෂිකව 175,000 ක් පමණ පුහුණුව අවසන් කරයි.

වෘත්තීය පුහුණුව මඟින් විශාල ශිල්පීන් ප්‍රමාණයක් වාර්ෂිකව පුහුණුව අවසන්කර සමාජගත කළ ද, ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව සමස්තයක් වශයෙන් සලකාබැලීමේ දී පුහුණුව අවසන්කළ ප්‍රමාණයෙන් විශාල ප්‍රමාණයක් සේවා වියුක්තව සිටින බව විවිධ වාර්තාවලින් පෙන්නුම් කර ඇත. එය කොපමණද කියනවානම් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුවේ වාර්තා, ලෝක බැංකු වාර්තා සහ විවිධ අධ්‍යයන තුළින් විවිධ ප්‍රතිශතයන් ඉදිරිපත් කර ඇත.

නමුත් අප වෘත්තීය පුහුණු ක්‍රමවේදය තුළ පුහුණුව අවසන් කළ ශිල්පීන් සමාජගත කිරීමෙන් පසු ඔවුන්ගේ ආර්ථික හා සමාජ තත්වය පිළිබඳ පසුවිපරමක් සිදු නොකිරීම සහ ඒ සඳහා නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කර නොමැති වීම පුහුණු ක්‍රමවේදය තුළ පවතින අඩුපාඩුවකි. මෙම තත්වය මත වෘත්තීය පුහුණුව හරහා සමාජගත කරන ශිල්පීන්ගේ රැකියාගත වීමේ ස්වභාවය හඳුනාගැනීමට අප පුහුණු ක්‍රමවේදයන් අපෝසත් වී ඇත.

ඒ අනුව වෘත්තීය පුහුණු තුලින් අපේක්ෂා කරන හැකියා පාදක කරගත් ආර්ථිකයක් ගොඩනැංවීමේ ජාතික කාර්ය සඳහා දායකත්වය නිශ්චිතව හඳුනාගැනීම අත්‍යාවශ්‍ය කාරණයක් වන අතර රටේ ශ්‍රම ඉල්ලුමට සරිලන ශිල්පීන් වෘත්තීය පුහුණුව මඟින් බිහිවනව ද එමඟින් රජය බලාපොරොත්තුවෙන අවසාන ප්‍රථිඵලය (OUTCOME) ආර්ථිකයට ලැබෙනවාද? පිළිබඳ හඳුනාගැනීම අත්‍යාවශ්‍ය කාරණයකි.





සමන් වික්‍රමසිංහ - සහකාර අධ්‍යක්ෂ
තොරතුරු පද්ධති අංශය

# සංවර්ධනය කරන ලද නව ජාතික නිපුණතා සම්මතයන් හා විෂය මාලා, 2020

## Level 1- 4

## Newly Developed NCSs & Curricular

1. Coach (Sports) - NVQ level 04
2. Driver - NVQ level 03
3. Sport Trainer (Physical Fitness) - NVQ level 04
4. Marine Fitter - NVQ level 04
5. Machine Operator (Rice Milling) - NVQ level 04
6. Maternal & Infant Caregiver
7. Crew Member (Pizzeria) - NVQ level 04
8. Computer Hardware & Network Technician - NVQ level 04
9. Embalmer - NVQ level 04
10. Driver Helper - NVQ level 02
11. Electrician Assistant - NVQ level 02
12. Health Care & Supporting Assistant - NVQ level 02
13. Sport, Fitness & Aquatic Center Assistant - NVQ level 02
14. Transport Helper - NVQ level 02
15. Outfit Maker - NVQ level 02
16. Early Childhood Development Centre Assistant - NVQ level 02
17. Communication Assistant - NVQ level 02
18. Vehicle Lube Serviceman - NVQ level 2 & 3
19. Community Health Assistant - NVQ level 2 & 3
20. Assistant Bungalow Keeper - NVQ level 3
21. Disaster Risk Reduction Assistant - NVQ level 3
22. Drug Prevention Assistant - NVQ level 3
23. Fishing Gear Repairer Assistant - NVQ level 3
24. Livestock Assistant - NVQ level 3
25. Environmental Conservation Assistant - NVQ level 3
26. Animal Keeper - NVQ level 3/4
27. Elephant Keeper (Mahout) - NVQ level 3/4
28. Transport Assistant - NVQ level 3
29. Aquarium Keeper - NVQ level 3/4
30. Automative Detailer - NVQ level 4
31. Dancer - NVQ level 3/4
32. Paper Recycling Technician (for persons with disabilities) - NVQ level 3/4

## Level 5 / 6

## Newly Developed NCSs & Curricular

1. Computer Numerrically Controlled Manufacturing Technology - NVQ level 5
2. Teaching English as a Second Language - NVQ level 5
3. Pharmaceutical Production technology - NVQ level 5
4. Fluid Power Technology (Hydraulic & Pneumatic) - NVQ level 5
5. Plantation Extension Management - NVQ level 5
6. Fabric Technology and Management - NVQ level 5
7. Building Construction Technology - NVQ level 5/6

## Newly Developed NCS

1. Textile and Apparel Manufacturing Technology - NVQ level 5

## Newly Developed Curriculum

1. Sea Food Technology - NVQ level 5/6

## Level 1- 4

## Revised NCS & Curricular

1. Auto mobile Tinker - NVQ level 3/4
2. Receptionist - NVQ level 4
3. Logistic Operations (Store Keeper) - NVQ level 3 & 4
4. First Aider - NVQ level 4
5. Fruit and vegetable Processer - NVQ level 3 & 4
6. Laboratory Assistant - NVQ level 3 & 4
7. Elevator Technician - NVQ level 3 & 4
8. Industrial Electronic Technician - NVQ level 3 & 4
9. Beautician - NVQ level 2
10. Customer Services Assistant (Petroleum) - NVQ level 2
11. Domestic Housekeeping Assistant - NVQ level 2,3
12. Field Assistant (Agriculture) - NVQ level 3
13. Supermarket Customer Service Assistant - NVQ level 2
14. Construction Craftsman (Masonry) - NVQ level 2
15. Plumber Assistant - NVQ level 2
16. Waiter/Steward - NVQ level 2
17. Beautician - NVQ level 3/4
18. Baker/Commis (Pastry and Bakery) - NVQ level 3/4
19. Automobile mechanic - NVQ level 2/3
20. Automobile Technician - NVQ level 4

21. Management Servic Officer - NVQ level 4
22. Management Servic Assistant - NVQ level 3
23. Machinist - NVQ level 3/4

## Revised NCS

1. Industrial Sewing Machine Operator (Team Member –Sewing) - NVQ level 2/3

## Revised Curriculum

1. Pattern Maker - NVQ level 3&4

# Level 5 / 6

## Revised NCS & Curricular

1. Hospitality Management - NVQ level 6
2. Accounting - NVQ level 5/6
3. Plantation Crop Technology - NVQ

# Level 5 / 6

## Revised Curriculum

1. Agricultural Production Technology - NVQ level 5/6

*ඩබ්ලිව්.ඒ.ඩබ්ලිව්. චන්ද්‍රානි ප්‍රේමරත්න - අධ්‍යක්ෂ*
*පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය*


### කතෘ මණ්ඩලය

*ඩබ්ලිව්.ඒ.ඩබ්ලිව්. චන්ද්‍රානි ප්‍රේමරත්න මහත්මිය - අධ්‍යක්ෂ*
*ජාතික වෘත්තීය සුදුසුකම් අංශය*

*පී.ඒ.එම්.යු. ගනේපොල මහතා - අධ්‍යක්ෂ*
*තොරතුරු පද්ධති අංශය*

*මංජුල විදානපතිරණ මහතා - වැඩ බලන අධ්‍යක්ෂ*
*කර්මාන්ත සම්බන්ධතා අංශය*

*අනුර වීරකෝන් මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ*
*තොරතුරු පද්ධති අංශය*

*චම්මික ගුණතිලක මහතා - වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ*
*තොරතුරු පද්ධති අංශය*

*භාෂිනී විතානගේ මහත්මිය - සහකාර අධ්‍යක්ෂ*
*ජාතික වෘත්තීය සුදුසුකම් අංශය*

*සමන් වික්‍රමසිංහ මහතා- සහකාර අධ්‍යක්ෂ*
*තොරතුරු පද්ධති අංශය*

*නදීෂ් ද සිල්වා - සහකාර අධ්‍යක්ෂ*
*තොරතුරු පද්ධති අංශය*

*ප්‍රියන්ත ධර්මසේන - සහකාර අධ්‍යක්ෂ*
*සැලසුම් සහ පර්යේෂණ අංශය*

*ඉන්දික සම්පත් - වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී*
*පාලන අංශය*


**අදහස් සහ යෝජනා**


**Tertiary and Vocational Education Commission**
'Nipunatha Piyasa', 354/2, Elvitigala Mawatha,
Colombo 05, Sri Lanka.
Tele : +94(0) 11 760 8000 Fax : +94(0) 11 255 5007
info@tvec.gov.lk, www.tvec.gov.lk